# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2093/43 - 2018 ඔක්තෝබර් මස 20 වැනි සෙනසුරාදා - 2018.10.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* KUDS/LND/01/ACQ/16.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* 4-3/4/2013/D/642.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාවය ලබා ගැනීමට රජය අදහස් කරන බැවින්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවයේ විස්තර:*

රණවිරු ගම්මානයක් සඳහා සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු උඩ පත්තුව සුළු කොට්ඨාසයේ, තැඹිලියන ගමේ පිහිටි රත්නපුර මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අගපි 226 අති.15 පත්‍ර 15 දරන පිඹුරේ ඉඩම් කොටස්.

**කැබලි අංක 199**

ඉඩමේ නම: පැරඬයිස්වත්ත; මුල් හිමිකම: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; වර්තමාන හිමිකම් කියන්නා: රජය; : ප්‍රමාණය: හෙක්ටයාර් 1.309.

**කැබලි අංක 200**

ඉඩමේ නම: පැරඬයිස්වත්ත; මුල් හිමිකම: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; වර්තමාන හිමිකම් කියන්නා: රජය; : ප්‍රමාණය: හෙක්ටයාර් 0.187.

ඉහත සඳහන් ඉඩම්වලට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 නොවැම්බර් මස 12 වැනි දින පෙ. ව. 11.00 ට කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 ඔක්තෝබර් මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

දිලිනි ධර්මදාස,
ප්‍රාදේශීය ලේකම්,
කුරුවිට.

2018 ඔක්තෝබර් මස 15 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-267

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/10/2013/UDA/277.
*මගේ යොමු අංකය :* ම/සං/02/කඩවත නගර සං.ඉ(අතිරේක) 1787.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර:-*

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධිකාරි පත්තුව සුළු කොට්ඨාසය ඉහල කරගහමුණ දකුණ ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 510838 සහ 2018/07/23 දිනැති කැඩැස්තර සිතියමේ කලාප 02න් 02 වැනි කලාපයේ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි.

**කැබලි අංක 421**

ඉඩමේ නම: නැදුන්ගහවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; : ප්‍රමාණය: හෙක්ටයාර් 0.0057.

**කැබලි අංක 422**

ඉඩමේ නම: නැදුන්මණ්ඩියවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; : ප්‍රමාණය: හෙක්ටයාර් 0.0317.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 නොවැම්බර් මස 15 වැනි දින පූ. භා. 10.30 ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 නොවැම්බර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

පුබුදිකා එස්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි
මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 ඔක්තෝබර් මස 17 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.